ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2016/01/21 |

## 2015 දෙසැම්බර් මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2013=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2015 නොවැම්බර් මාසයේ දී වාර්තා කළ සියයට 4.8 හි සිට 2015 දෙසැම්බර් මාසයේ දී සියයට 4.2 දක්වා පහළ ගියේය. 2015 දෙසැම්බර් මස වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමනය සියයට 3.8 කි.



ජාතික පාරිභෝගික මිල දර්ශකය 2015 නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා සියයට 1.1 කින් ඉහළ ගියේය. ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් කාණ්ඩයේ අයිතමයන්හි මිල ගණන් ඉහළ යාම, දර්ශකයේ මෙම මාසික ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. එළවළු, අමු මිරිස්, සහල් සහ නැවුම් මත්ස්‍ය මිල ගණන් මෙම මාසය තුළ දී ඉහළ ගියේය. මේ අතර, ලොකු ළූනු, දෙහි, අර්තාපල්, වියලි හාල්මැස්සන් සහ කුකුළු මස් මිල පහළ ගියේය. මධ්‍යසාර පාන, දුම්කොළ හා මත්ද්‍රව්‍ය; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ ඒකක නඩත්තුව; ප්‍රවාහන; අධ්‍යාපන; සහ ආපනශාලා හා හෝටල් යන උප කාණ්ඩවල මිල ගණන් ද 2015 දෙසැම්බර් මාසය තුළ දී ඉහළ ගියේය. රෙදිපිළි හා පාවහන්; සහ නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන යන උප කාණ්ඩවල මිල ගණන් පහළ ගියේය. සෞඛ්‍ය; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; සහ විවිධ භාණ්ඩ හා සේවා උප කාණ්ඩ සාමාන්‍ය වශයෙන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.

**ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම**

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | මාසික % වෙනස | ලක්ෂ්‍යමය % වෙනස | වාර්ෂික සාමාන්‍ය % වෙනස |
|---|---|---|---|---|---|
| 2014 | ජනවාරි | 103.1 | | | |
| | පෙබරවාරි | 103.0 | -0.1 | | |
| | මාර්තු | 103.2 | 0.2 | | |
| | අප්‍රේල් | 104.1 | 0.9 | | |
| | මැයි | 104.9 | 0.8 | | |
| | ජූනි | 106.2 | 1.2 | | |
| | ජූලි | 107.0 | 0.8 | | |
| | අගෝස්තු | 106.4 | -0.6 | | |
| | සැප්තැම්බර් | 106.4 | 0.0 | | |
| | ඔක්තෝබර් | 106.0 | -0.4 | | |
| | නොවැම්බර් | 106.9 | 0.8 | | |
| | දෙසැම්බර් | 108.6 | 1.6 | | |
| 2015 | ජනවාරි | 112.8 | 3.9 | 9.4 | |
| | පෙබරවාරි | 108.9 | -3.5 | 5.7 | |
| | මාර්තු | 107.6 | -1.2 | 4.3 | |
| | අප්‍රේල් | 107.0 | -0.6 | 2.8 | |
| | මැයි | 108.0 | 0.9 | 3.0 | |
| | ජූනි | 109.1 | 1.0 | 2.7 | |
| | ජූලි | 108.9 | -0.2 | 1.8 | |
| | අගෝස්තු | 108.4 | -0.5 | 1.9 | |
| | සැප්තැම්බර් | 108.4 | 0.0 | 1.9 | |
| | ඔක්තෝබර් | 109.2 | 0.7 | 3.0 | |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 | |
| | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 | 3.8 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව